Faculty of Social
Sciences
University of Kelaniya
Sri Lanka

# *ශ්‍රී ලංකා සමාජය තුළ මැලේ ජාතීන්ගේ ව්‍යාප්තිය.*

ජේ. එම්. වයි. මධුශානි [1]

එච්. එච්. එන්. එස්. හේවාවසම් [2]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකා සමාජය තුළ "ජා මිනිසුන්, ජා මනුස්සාර්" ලෙස හඳුනාගත් මැලේ ජාතීන්ගේ ව්‍යාප්තිය සිදුවන්නේ සියවස් ගණනාවක ඉහත දී ය. 17 වන හා 19 වන සියවස තුළ දී ලන්දේසි හා බ්‍රිතාන්‍ය යන යුරෝපීය ජාතීන්ගේ අවශ්‍යතාවයන් හරහා ලංකාවට ගෙන්වන ලද මැලේ ජාතීන් ලංකාවේ එක් එක් ප්‍රදේශවල වර්ධනය විය. ඒ අනුව කොළඹ, හම්බන්තොට, නුවර හා බදුල්ල ප්‍රදේශවල මෙම ජාතීන්ගේ ව්‍යාප්ත වීම දැකගත හැකි වේ. මෙලෙස ලංකාවේ විවිධ ප්‍රදේශවල ජීවත් වූ ජනතාව අතරින් කොළඹ නගරයේ මරදාන ප්‍රදේශයේ ව්‍යාප්ත වූ ජන කොටස ආරම්භයේ සිට 20 වන සියවස දක්වා වර්ධනය වීමේ දී ඔවුන් සමාජයේ විශේෂ අවධානයකට ලක් වූ පිරිසක් ද යන වග සොයා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වේ.
සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන ප්‍රධාන ජාතීන්ට අමතරව මෙරට ජීවත්වන අනෙක් සුළු ජාතීන්ගේ කොටසට අයත්වන මෙම මැලේ ජාතීන්ගේ ආරම්භය හා විකාශය පිළිබඳව ද ඔවුන්ගේ සංස්කෘතිය, භාෂාව, ආගම යන අංශයන් පිළිබඳව ද මෙහිදී අවධානය යොමු කෙරේ. යුරොපීයයන් යටතේ මෙම ජාතීන්ගේ මව්බිමෙහි වැසියන් අතරින් සොල්දාදුවන් ලෙස, නීතියෙන් වරදකරුවන් වූ පිරිස් ලෙස හා විප්ලවකාරී පිටුවහල් කරන්නන් ලෙස මෙරට සමාජය තුළට එකතු වූ මෙම පිරිස ක්‍රමයෙන් ලංකාවේ සමාජයට අනුගත වීමත් ඔවුන්ගේ ව්‍යාප්තිය සිදු වූයේ ශීඝ්‍ර ලෙසට ද නැත්නම් මන්දගාමී අයුරින් ද යන කරුණ පිළිබඳව මෙහිදී විශේෂ අවධානය යොමු කෙරේ. මැලේවරුන් පිළිබඳව විශාල වශයෙන් පෙර පර්යේෂණ සිදු වී නැතත් පවත්නා තොරතුරු අනුව පැහැදිලි වන්නේ ඔවුන් තමන්ට අනන්‍ය වූ සංස්කෘතියක ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් ශ්‍රී ලාංකික සමාජය තුළ ජීවත් වන බව ය. මොවුන් එක් ප්‍රදේශයකට සීමා වී වර්ධනය වී තිබීම ද සුවිශේෂී වේ. එමෙන්ම මොවුන් නාගරික වශයෙන් ව්‍යාප්ත වී තිබේ. මෙම ජාතීන් පිළිබඳ පර්යේෂණයේ දී සාහිත්‍යමය මූලාශ්‍රයයන් හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු එක්රැස් කරනු ලැබේ. ව්‍යවහාරයේ දී "ජා" මිනිසුන් නමින් හැඳින්වෙන මැලේ ජාතිකයන් ශ්‍රී ලාංකික සමාජය හා සම්මිශ්‍රණය වී සිටිය ද, 20 වන සියවස වන විටත් ජන සංඛ්‍යාව අතින් පහළ අනුපාතිකයක සිටින හෙයින් ඔවුහු සමාජය තුළ කැපී පෙනෙන ජන කොටසක් බවට පත් නොවූහ.

ප්‍රමුඛ පද : සමාජය, ජාතීන්, මැලේ, ව්‍යාප්තිය.

*1. ඉතිහාසය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*